# ප්‍රසම්පාදන දැන්වීම

## ඌව පළාත් සභාව

## නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) කාර්යාලය

ඌව පළාත් සභාවේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) කාර්යාලයේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පහත සඳහන් කර්මාන්ත ඉටුකිරීම සඳහා ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) හා අදාල ක්ෂේත්‍රයේ ලියාපදිංචිය සහිත සුදුසුකම් ලත් කොන්ත්‍රාත්කරුවන් හා ඉදිකිරීම් ආයතන අතුරින් 2019.04.29 දක්වා තරඟකාරී ලංසු කැඳවීමේ පදනම මත මුද්‍රා තබන ලද ලංසු භාරගනු ලැබේ.

| අනු අංකය | කර්මාන්තයේ නම | ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂේත්‍රයේ අවශ්‍ය අවම CIDA ශ්‍රේණිය | ආපසු ගෙවන ලංසු සුරක්ෂණ මුදල (මුදලින් ගෙවන්නේනම්) (රු.) | ඉදිකිරීම් කාල පරාසය (දින ගණන) | ලංසු ලියවිලි ගාස්තු මුදල (රු.) | ලංසුපත් නිකුත් කරන කාර්යාලය |
|---|---|---|---|---|---|---|
| 1 | ගිරාඳුරුකෝට්ටේ දිසා රෝහලේ සූර්ය බල විදුලි පද්ධතිය ස්ථාපිත කිරීම | උපවගන්තිය 04 යටතේ දක්වා ඇත | 83,000.00 | 90 | 5,000.00 | පළාත් ගොඩනැගිලි අධ්‍යක්ෂ කාර්යාලය |
| 2 | දෙමෝදර ආදාහනාගාරය අසල සූර්ය බලශක්තිය මගින් ක්‍රියාත්මක වීදි ලාම්පු සවි කිරිම | | 10,000.00 | 120 | 5,000.00 | |
| 3 | දෙමෝදර පොදු ක්‍රිඩාංගණය අසල සූර්ය බලශක්තිය මගින් ක්‍රියාත්මක වීදි ලාම්පු සවි කිරිම | | 10,000.00 | 120 | 5,000.00 | |
| 4 | ඇල්ල ආරුක්කු 09 පාලම අසල සූර්ය බලශක්තිය මගින් ක්‍රියාත්මක වීදි ලාම්පු සවි කිරිම | | 10,000.00 | 120 | 5,000.00 | |
| 5 | වැලිමඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ සූර්ය බලශක්තිය මගින් ක්‍රියාත්මක වීදි ලාම්පු සවි කිරිම | | 20,000.00 | 120 | 5,000.00 | |
| 6 | මහියංගණය බ/සිද්ධාර්ථ ප්‍රාථමික විද්‍යාලය සඳහා 110*25 ගොඩනැගිල්ලේ ඉහළ මහල ශාලාවක් ලෙස ඉදි කිරීම | C6 | 52,000.00 | 150 | 5,000.00 | |
| 7 | බඩල්කුඹුර මො/අලුපොත මුස්ලිම් ප්‍රාථමික විද්‍යාලය සඳහා 110*25 දෙමහල් ගොඩනැගිල්ලක් ඉදි කිරීම(I අදියර )හා රැඳවුම් බැමි ඉදිකිරිම | C6 | 91,000.00 | 300 | 5,000.00 | |
| 8 | බණ්ඩාරවෙල බ/සර් රසීක් ෆරීඩ් විද්‍යාලය සඳහා 90*25 දෙමහල් පංතිකාමර ගොඩනැගිල්ලක් ඉදිකිරීම (I අදියර ) හා රැඳවුම් බැමි ඉදිකිරිම | C6 | 79,000.00 | 270 | 5,000.00 | |
| 9 | බිබිල මො/ඔබ්බෙගොඩ ද්විතීයික විද්‍යාලය සඳහා 90*25 දෙමහල් ගොඩනැගිල්ලක් ඉදි කිරීම - I අදියර | C6 | 58,000.00 | 210 | 5,000.00 | |
| 10 | වියළුව බ/නුරානියා මුස්ලිම් විද්‍යාලය සඳහා 70*25 දෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම | C6 | 79,000.00 | 365 | 5,000.00 | |
| 11 | බ/වැලිමඩ මුස්ලිම් විද්‍යාලය සඳහා 110*25 දෙමහල් පංතිකාමර ගොඩනැගිල්ලක් ඉදිකිරීම-I අදියර | C6 | 63,000.00 | 180 | 5,000.00 | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 12 | බදුල්ල බ/ෆාතිමා මුස්ලිම් විද්‍යාලයේ 90*25 තෙමහල් ගොඩනැගිල්ලේ අවසන් අදියර ඉදිකිරීම හා රුදවුම් බැම් ඉදිකිරීම | C6 | 55,000.00 | 210 | 5,000.00 | පළාත් ගොඩනැගිලි අධ්‍යක්ෂ කාර්යාලය |
| 13 | බණ්ඩාරවෙල බ/දෝව විද්‍යාලය සඳහා 80*20 පංතිකාමර ගොඩනැගිල්ලක් ඉදිකිරීම හා රුදවුම් බැම් ඉදිකිරීම | C7 | 44,000.00 | 120 | 5,000.00 | බණ්ඩාරවෙල ප්‍රාදේශීය ඉංජිනේරු (ගොඩනැගිලි) කාර්යාලය |
| 14 | බ/වැලිමඩ විජය විද්‍යාලය සඳහා 90*25 ගොඩනැගිල්ලේ අවසන් අදියර ඉදි කිරීම | C7 | 34,000.00 | 150 | 5,000.00 | |
| 15 | වැලිමඩ බ/ලන්දෙගම විද්‍යාලය සඳහා 60*20 ගොඩනැගිල්ලක් ඉදි කිරීම | C7 | 31,000.00 | 120 | 5,000.00 | |
| 16 | බණ්ඩාරවෙල බ/සොරගුනේ විද්‍යාලය සඳහා 80*20 පංතිකාමර ගොඩනැගිල්ලක් ඉදිකිරීම | C7 | 31,000.00 | 120 | 5,000.00 | |
| 17 | බිබිල මො /ගොඩිගමුව මුස්ලිම් විද්‍යාලය සඳහා 90*25දෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම-අවසන් අදියර | C7 | 48,000.00 | 150 | 5,000.00 | බිබිල ප්‍රාදේශීය ඉංජිනේරු (ගොඩනැගිලි) කාර්යාලය |
| 18 | මහියංගණය බ/දඹගොල්ල කණිෂ්ඨ විද්‍යාලයේ 80*20 ගොඩනැගිල්ල අළුත්වැඩියාව | C8 | 12,000.00 | 120 | 5,000.00 | |
| 19 | පස්සර බ/වැවබැද්ද විද්‍යාලය සඳහා 80*20 ගොඩනැගිල්ලක් ඉදි කිරීම | C7 | 49,000.00 | 270 | 5,000.00 | බදුල්ල ප්‍රාදේශීය ඉංජිනේරු (ගොඩනැගිලි) කාර්යාලය |
| 20 | බදුල්ල බ/වියදිගුණ මහා විද්‍යාලය සඳහා 100*20 ගොඩනැගිල්ලක් ඉදිකිරීම හා රුදවුම් බැම් ඉදිකිරීම. | C7 | 48,000.00 | 180 | 5,000.00 | |
| 21 | බදුල්ල බ/රිල්පොල ධර්මරාජ විද්‍යාලය සඳහා 80*20 පංතිකාමර ගොඩනැගිල්ලක් ඉදිකිරීම | C7 | 41,500.00 | 180 | 5,000.00 | |
| 22 | වැල්ලවාය මො/හඳපානාගල මහා විද්‍යාලය සඳහා 80*20 පංතිකාමර ගොඩනැගිල්ලක් ඉදිකිරීම | C7 | 29,500.00 | 180 | 3,000.00 | වැල්ලවාය ප්‍රාදේශීය ඉංජිනේරු (ගොඩනැගිලි) කාර්යාලය |
| 23 | තණමල්විල මො /කොටවෙහෙර මංකඩ මහ විද්‍යාලය සඳහා 80*20 පංතිකාමර ගොඩනැගිල්ලක් ඉදිකිරීම | C7 | 28,000.00 | 180 | 3,000.00 | |
| 24 | තණමල්විල මො /මහගම ආදර්ශ ප්‍රාථමික විද්‍යාලය සඳහා 80*20 පංතිකාමර ගොඩනැගිල්ලක් ඉදිකිරීම | C7 | 27,000.00 | 180 | 3,000.00 | |
| 25 | මොණරාගල මො/ හුලංදාව දකුණ මහා විද්‍යාලය සඳහා 60*25 ගොඩනැගිල්ලක් ඉදි කිරීම | C7 | 38,000.00 | 180 | 3,000.00 | මොණරාගල ප්‍රාදේශීය ඉංජිනේරු (ගොඩනැගිලි) කාර්යාලය |
| 26 | බිබිල මො/කොල්ලදෙණිය මහා විද්‍යාලය සඳහා 60*20 ගොඩනැගිල්ලක් ඉදි කිරීම | C7 | 29,000.00 | 180 | 3,000.00 | |

02. ප්‍රසම්පාදන ක්‍රමය

- <u>අංක 1 කර්මාන්ත සඳහා</u>
  ද්විත්ව කවර තනි අදියර ක්‍රමය යටතේ ජාතික තරඟකාරී ලංසුකරණය මඟින් ප්‍රසම්පාදනය සිදු කරණු ලැබේ. ලංසුකරුවන් සඳහා වන උපදෙස් හි විධිවිධාන සහ කොන්ත්‍රාත්තුවේ පොදු කොන්දේසි CIDA/ SBD/04 සැලසුම් නිර්මාණය සහ ගොඩනැගීමේ කොන්ත්‍රාත් හී විධිවිධාන වේ.
- <u>අංක 2 සිට අංක 5 දක්වා වන කර්මාන්ත සඳහා</u>
  ලංසු කැඳවීම ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) ලියාපදිංචිය හෝ අදාල ක්ෂේත්‍රයේ ලියාපදිංචිය සහිත සුදුසුකම් ලත් කොන්ත්‍රාත්කරුවන් අතරින් ජාතික තරඟකාරී ලංසුකරණ පටිපාටිය යටතේ පැවැත්වේ.

- <u>අංක 6 සිට අංක 26 දක්වා වන කර්මාන්ත සඳහා</u>
  ලංසු කැඳවීම ඌව පළාත තුල පදිංචි ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) ලියාපදිංචිය සහිත සුදුසුකම් ලත් කොන්ත්‍රාත්කරුවන් අතරින් තරඟකාරී ලංසු කැඳවීමේ ක්‍රමය මගින් සිදුකරනු ලැබේ.

03. ඉහත වගුවේ සඳහන් අවම **සීඩා (CIDA)** හා අදාල **ක්ෂේත්‍රයේ ලියාපදිංචිය සහිත අසාධු ලේඛණ ගත නොවූ සාර්ථක, යෝග්‍යතා පූර්ණ** ලංසුකරුවන් ලංසු ප්‍රදානය සඳහා සුදුසුකම් ලබති.

04. ලංසු ඇගයීමේදී පහත සඳහන් සුදුසුකම් සලකා බලනු ලැබේ.

<u>අංක 1 සිට අංක 5 දක්වා වන කර්මාන්ත සඳහා</u>

I. ලංසුකරු ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ ලියාපදිංචි වී තිබිය යුතු අතර ලංසු සමඟ අදාල සහතිකයේ පිටපතක් ඉදිරිපත් කළ යුතුයි.
II. ලංසුකරු සතුව (CIDA) ලියාපදිංචිය හෝ අදාල ක්ෂේත්‍රයේ ලියාපදිංචිය තිබිය යුතුය.
III. පසුගිය වසර පහ තුල සමාන ස්වභාවයේ කොන්ත්‍රාත් 2ක් සාර්ථකව නිම කොට තිබිය යුතුය.
IV. පසුගිය තෙවසර තුල රු. මිලියන 5 කට වැඩි වාර්ෂික පිරිවැටුම් සාමාන්‍යයක් පවත්වාගෙන තිබිය යුතුය.

<u>අංක 6 සිට අංක 26 දක්වා වන කර්මාන්ත සඳහා</u>

I. පසුගිය වසර පහ තුල සිවිල් වැඩ වටිනාකමින් 60%ක් හෝ ඊට සමාන එක් කර්මාන්තයක් ඉටුකර ඇති පළපුරුද්ද. **(ඉහත වගුවේ අවම අවශ්‍ය සීඩා ශ්‍රේණිය C7 හා C8 ඉල්ලා ඇති කර්මාන්ත සඳහා මෙම කොන්දේසිය අදාළ නොවේ)**
II. පසුගිය වසර පහ තුල ඉහත ඉදිකිරීමේ සිවිල් වැඩ වලට සමානව පවත්වාගෙන ගිය සාමාන්‍ය පිරිවැටුම.
III. මූල්‍යමය හැකියාව.
IV. දැනට කර ගෙන යන වැඩ වල මූල්‍ය හා භෞතික ප්‍රගතිය

05. ලංසු වටිනාකම රුපියල් මිලියන 05ක් හෝ ඊට වැඩි අගයක් සහිත කර්මාන්ත සඳහා **1987 අංක 03 දරණ පොදු කොන්ත්‍රාත් ගිවිසුම් පනත** යටතේ ලියාපදිංචි විය යුතු අතර, ලංසු සමඟ එම ලියාපදිංචි සහතිකය ඉදිරිපත් කළ යුතුය. එම ලියාපදිංචි සහතිකය අමුණා නොමැතිවීම ලංසු ප්‍රතික්ෂේප කිරීමට හේතුවක් වේ.

06. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් හට ඉහත වගුවේ සඳහන් කාර්යාල වෙත ලිඛිත ඉල්ලුම්පතක් ඉදිරිපත් කිරීමෙන් ප්‍රසම්පාදන ආකෘතිපත් වල සම්පූර්ණ ඉංග්‍රීසි භාෂාමය පිටපතක් **2019.03.28** සිට **2019.04.26** දින දක්වා කාර්යාල වේලාවන් තුළදී ඉහත වගුවේ සඳහන් පරිදි ලංසු ලියවිලි ගාස්තුව ගෙවීමෙන් පසු ලබා ගත හැකි අතර, අයකිරීමකින් තොරව පරික්ෂා කළ හැක.

07. ලංසු සුරක්ෂණය මුදලින් නොගෙවන්නේනම් ලංසු සමඟ ලංසු සුරක්ෂණ ඇපකරයක් අමුණා එවිය යුතුය. **ලංසු සුරක්ෂණය** සඳහා වගුවේ සඳහන් ලංසු සුරක්ෂණ මුදල මෙන් ***දෙගුණයක්*** වටිනාකමින් යුත් **ශ්‍රී ලංකා මහා බැංකුවේ අනුමත කළ වාණිජ බැංකුවකින් ලබාගත් ඇපකරයක් ඉදිරිපත් කල හැකිය. මෙය කොන්දේසි රහිතව ඉල්ලූවිට ගෙවනු ලබන ඇපකරයක් විය යුතුය.**

ලංසු ඇපකර වලංගු කාලය
<u>**අංක 1 කර්මාන්ත සඳහා**</u>

ලංසු ඇපකරය 2019 .09. 29 වෙනි දින දක්වා වලංගු විය යුතුය.

<u>**අංක 2 සිට අංක 26 දක්වා වන කර්මාන්ත සඳහා**</u>
ලංසු ඇපකරය 2019.08.29 වෙනි දින දක්වා වලංගු විය යුතුය

08. නිසි පරිදි සම්පූර්ණ කරන ලද ලංසු පිටපත් දෙකකින් යුතුව අදාළ ප්‍රසම්පාදන කමිටුව වෙත **2019.04.29** වන දින **ප.ව. 2.00** ට පෙර ඉදිරිපත් කළ යුතු අතර, ලංසුපත් වල මුල් පිටපත හා අනු පිටපත යනුවෙන් සඳහන් කර වෙන් වෙන්ව කවර දෙකක බහා එම කවර දෙක එක් ලිපි කවරයක බහා, ඉහළ වම් කෙළවරේ අදාළ කර්මාන්තයේ නම සඳහන් කර මුද්‍රා තබා, **සභාපති , ප්‍රසම්පාදන කමිටුව , නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) කාර්යාලය, පිංඅරාව, බදුල්ල** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ එම කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම සිදුකළ යුතු අතර, ප්‍රමාද වී ලැබෙන ලංසුපත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

09. අනු පිටපත, මුල් පිටපතේ සෑම පිටුවකම සහතික කරන ලද ඡායාස්ථ පිටපතක් විය යුතුය

10. අදාළ වැඩි විස්තර, නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) කාර්යාලයට අයත් 055 – 2222218 , ගොඩනැගිලි අධ්‍යක්ෂ කාර්යාලයට අයත් 055-2229629,බදුල්ල ප්‍රාදේශීය ඉංජිනේරු (ගොඩනැගිලි) කාර්යාලයට අයත් 055-2224753,බණ්ඩාරවෙල ප්‍රාදේශීය ඉංජිනේරු (ගොඩනැගිලි) කාර්යාලයට අයත් 057-2222025,වැල්ලවාය ප්‍රාදේශීය ඉංජිනේරු (ගොඩනැගිලි) කාර්යාලයට අයත් 055-2274362,මොණරාගල ප්‍රාදේශීය ඉංජිනේරු (ගොඩනැගිලි) කාර්යාලයට අයත් 055-2276038 හා බිබිල ප්‍රාදේශීය ඉංජිනේරු (ගොඩනැගිලි) කාර්යාලයට අයත් 055-2265317 යන දුරකථන අංක වලින් ලබා ගත හැක.

11. ලංසු වලංගු කාලය

<u>**අංක 1 කර්මාන්ත සඳහා**</u>
ලංසු 2019 .08. 29වෙනි දින දක්වා වලංගු විය යුතුය.

<u>**අංක 2 සිට අංක 26 දක්වා වන කර්මාන්ත සඳහා**</u>
ලංසු 2019 .07.29 වෙනි දින දක්වා වලංගු විය යුතුය

**12. 2019.04.29** දින **ප.ව. 2.00** ට බදුල්ල, **නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා)** කාර්යාලයේදී ලංසු විවෘත කරන අතර, එම අවස්ථාවට ලංසුකරුට හෝ ඔහුගේ නියෝජිතයින්ට සහභාගී විය හැක.

13. ලංසු කැඳවීම සම්බන්ධ පූර්ව ලංසු රැස්වීමක් (Pre Bid Meeting), **2019.04.10** දින **පෙ.ව.10.00** ට **බදුල්ල, පිංඅරාව, පළාත් ගොඩනැගිලි අධ්‍යක්ෂ කාර්යාලයේදි** පැවැත්වෙන අතර, එහිදී අපේක්ෂිත ලංසුකරුවන්ට ව්‍යාපෘති අවශ්‍යතා සම්බන්ධව පැහැදිලි කිරීම් ඉල්ලා සිටිය හැක. තවද අවශ්‍ය නම් වැඩ බිම් සංචාරයක්ද පිළියෙල කල හැක.

14. ලද ලංසු අතරින් යෝග්‍ය ලංසුවක් පිලිගැනීම හෝ සියල්ලම ප්‍රතික්ෂේප කිරීමේ සම්පූර්ණ අයිතිය ප්‍රසම්පාදන කමිටුව සතුවන අතර, ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසාන තීරණය වේ.

**සභාපති - ප්‍රසම්පාදන කමිටුව**
**නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) කාර්යාලය,**
**පිංඅරාව, බදුල්ල**
**දු.ක / ෆැක්ස් අංකය - 055-2222218, ඊ.මේල්-** dcsengupc@gmail.com
**දිනය: 2019.03.25**